DOI: 10.31357/fhssmst.2003.00030

# පහතරට ශාන්තිකර්මවල එන අග්නි සංකල්පය

## උපදේශකවරුන්ගේ ප්‍රකාශය:

"පහතරට ශාන්තිකර්මවල එන අග්නි සංකල්පය " පිළිබඳ විමසුමක් නමැති මෙම පර්යේෂණ නිබන්ධය අපගේ උපදෙස් පරිදි මෙම පර්යේෂකයා විසින් සම්පාදනය කරන ලද බවත්, 2003.10.08 දින මෙම නිබන්ධය පිළිබඳ පැවති වාචික පරීක්ෂණයේ දී පරීක්ෂකවරුන් විසින් යෝජිත සංශෝධනය ද අතුළත් කොට නැවත සකස් කර ඉදිරිපත් කර ඇති බවත්, මෙයින් සහතික කරමු.

..............................................

මහාචාර්ය වෝල්ටර් මාරසිංහ.

..............................................

මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර

## පර්යේෂකයාගේ ප්‍රකාශය :

මෙ පර්යේෂණ නිබන්ධය උපදේශකවරුන්ගේ අනුමැතියට යටත්ව මා විසින් ස්වාධීනව සම්පාදනය කරන ලද්දක් බවත්, 2003. 10. 08 වෙනි දින මෙම නිබන්ධය පිළිබඳ පැවති වාචික පරීක්ෂණයේ දී පරීක්ෂකවරුන් විසින් යෝජිත සංශෝධන ද ඇතුළත් කොට නැවත සකස් කළ බවත්, සහතික කරමි.

පර්යේෂකයාගේ අත්සන.

(අස්සලාරච්චිගේ කමනි මනෝරි සේමසිංහ මනම්පේරි )

## උපදේශකවරුන් ගේ ප්‍රකාශය

"පහතරට ශාන්තිකර්මවල එන අග්නි සංකල්පය" යන මාතෘකාව යටතේ මෙම පර්යේෂණ නිබන්ධය අප ගේ උපදෙස් පරිදි මෙම පර්යේෂිකාව විසින් සම්පාදනය කරන ලද බව මෙයින් සහතික කරමු.

............................................ ............................................

මහාචාර්ය චන්දිම විජයබණ්ඩාර මහාචාර්ය වෝල්ටර් මාරසිංහ

## පර්යේෂකයා ගේ ප්‍රකාශය

මෙම පර්යේෂණ නිබන්ධය උපදේශකවරයන් ගේ සුපරීක්ෂකත්වය යටතේ ම විසින් ස්වාධීන ව සම්පාදනය කරන ලද්දක් බවත් මෙයින් සහතික කරමි.

...........................................

පර්යේෂකයා ගේ අත්සන



# පහතරට ශාන්තිකර්මවල එන අග්නි සංකල්පය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයේ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ නිබන්ධය.


අස්සලාරච්චිගේ කමනි මනෝරි සේමසිංහ මනම්පේරි.

ලේඛනාරූඪ අංකය : A / 28158

භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය,

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,

ගංගොඩවිල,

නුගේගොඩ.



2003

# පිදුම

සියලු දුක් දොම්නස් විඳ දරාගනිමින්

මහමෙරක් මෙන් නොසැලී

දාරක ස්නේහය උතුලන

මාගේ පමණක් නො ව

සියලු ප්‍රජාව ගේ

නැණ පහන් දල්වාලන

දිරිය මව්නි,

ඔබටත්, විශ්ව අම්මාවරුන්ටත්,

මෙම කුළුදුල් කෘතිය බැති සිතින් පුදමි !

# උපකාරානුස්මෘතිය

මෙම පර්යේෂණ කාර්යයයේ දී ඉමහත් කැපවීමෙන් උදව් කළ බොහෝ පිරිස් වේ. ඉන් කිහිප දෙනෙකුන් හෝ සිහිපත් කිරීම මාගේ යුතුකමක් සේ සලකමි.

භාෂා හා සංස්කෘතික අධ්‍යයන අංශයේ අධ්‍යයන අංශ ප්‍රධාන තුමිය ආචාර්ය බන්ඩාර මැණිකේ විජේතුංග මහත්මිය සිය අධ්‍යයන අංශයේ කණිටු සාමජිකයින් ගේ අභිවෘද්ධිය නිරතුරු අපේක්ෂා කරන ඕ තොමෝ මා රාජකාරී කටයුතුවලින් නිදහස් කර මාගේ අධ්‍යයන කටයුතු පිළිබඳ ව නිතර සොයා බලමින් මවකමෙන් මා දිරිමත් කළහ. එතුමියට හෘද්‍යාංගම ස්තුතිය පුදකර සිටිමි.

නවක පර්යේෂකයකු වශයෙන් මුහුණ දීමට සිදු වූ සියලු බාධක මැඩගෙන උද්යෝගයෙන් යුතු ව, මෙම පශ්චාද් උපාධි පර්යේෂණයේ නියැළීමට අවශ්‍ය ශාස්ත්‍රෝද්ග්‍රහණය ලබාදුන් විද්වත්හු දෙපලක් වෙති. ඒ මාගේ උපදේශක මහාචාර්යවරුන් වන ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යලයේ ශාස්ත්‍ර පීඨාධිපති මහාචාර්ය චන්දිම විජයබණ්ඩාර සහ මහාචාර්ය වෝල්ටර් මාරසිංහ ගුරු පිතෘන් දෙපළ යි. ඔවුන් ගේ අධීක්ෂණය යටතේ මෙකී පර්යේෂණය කිරීමට ලැබීම මා ලත් මහත් භාග්‍යක් ලෙස සලකන අතර ඒ විද්වත් දෙපළට මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

නිල වශයෙන් මා ගේ උපදේශකයකු නො වූව ද මහත් සෙනෙහසින් යුතු ව විෂයානු බද්ධ ගැටලු තැන් ද නිරාකරණය කරදෙමින් මට අනුග්‍රහ කළ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ මහාචාර්ය ටෙනිසන් පෙරේරා ගුරුතුමාණන් විසින් කරන ලද අමිල මෙහෙයට හද බැති පුද කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් විසින් පවත්වන ලද දේශනය මාගේ විශ්වවිද්‍යාල දිවියෙහි ප්‍රථම දේශනය විය. එයින් ම මේ විෂය කෙරෙහිත් ශාස්ත්‍රීය පර්යෙෂණ කෙරෙහිත් ඇල්ම වර්ධනය කළා වූ ද පර්යේෂණ හා ක්‍රම වේදය පිළිබඳ ව මනා දැනුම් සම්භාරයක් ලබාදුන් මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාට ගුරුබැතියෙන් යුතු ව මාගේ කෘතඥතාව සටහන් කරමි.

"මිතුරු තුමෝ දුක සැප දෙකෙහි ම පිහිටි" යන වැකිය සනාථ කරමින් මා දිරිගැන්වූ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ, ආචාර්ය ප්‍රණීත් අබේසුන්දර, කුසුමලතා ලංකා මුල්ල, ඇතුළු මෙම විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයේ ස්වාමීන් වහන්සේලා හා අචාර්ය භවතුන් වෙත ද මාගේ සතුට හා ස්තුතිය පිරි නැමේ.

පහතරට නර්තන ශිල්ප ශාස්ත්‍රයට අත්පොත් තැබූ අභාවප්‍රාප්ත කේ.ඇස්. ප්‍රනාන්දු ගුරු පියාණන් සහ ඉන්ද්‍රානි සෝමලතා ගුරුමෑණියන් බැති සිතින් යුතු ව සිහිපත් කරමි."

තව ද පර්යේෂණ කාර්යයේ දී නිබඳ ව ම උදවු උපකාර කළ ගාල්ලේ වෛද්‍ය පීඨයේ මනෝ විශේෂඥ ඩී. වී. ජේ. හරිස්චන්ද්‍ර සහ මනෝවිද්‍යාව සහ දර්ශනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඥානදාස පෙරේරා යන විද්වතුන් හට විශේෂ ස්තුතිය පුද කරමි.

පාරම්පරික නර්තන ශිල්පීන් වන ඒඩින් වීරසිංහ ඇදුරුතුමාණන්, එස්. එල්. එච්. ප්‍රනාන්දු ඇදුරුතුමාණන්, සහ පරවාහැර සෝමතිලක ඇදුරුතුමාණන්, ඇතුළු පාරම්පරික නර්තන ක්ෂේත්‍රය මෙරටට උරුම කර දුන් සියලු ම නර්තන ශිලිපීන්ගෙන් මෙම පර්යේෂණය සඳහා මට ලබාදුන් වාචික සාකච්ඡා බෙහෙවින් අගේකොට සළකමි. ඒ වෙනුවෙන් මාගේ කෘතඥතාවය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පුස්තකාලයේ සිට මෙම අධ්‍යයන කටයුත්ත මානසික ඒකාග්‍රතාවෙන් යුතුව කිරීමට අවශ්‍ය පසුබිම සකසා දුන් පුස්තකාලයාධිපති විදානපතිරණ මහතා ඇතුළු සුහදශීලී කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන්ටත් මාගේ ස්තුතිය නිබඳ ව ම හිමි වේ. වෙනත් පුස්තකාල පරිහරණයේ දී, කොළඹ ජාතික පුස්තකාලය, කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලය, සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ පුස්තකාලය, ඉන්දියානු සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාලයන්හි මහත්ම -මහත්මීන් ද සතුටු සිතින් යුතු ව සිහිපත් කරමි.

මෙම පර්යේෂණයේ පරිගණක කටයුතුවලට ඉතා උනන්දුවෙන් සහාය දුන් Pink Communicatoion ආයතනයටත්, සමර් හවුස් හි ආනන්ද, ශ්‍රී ජයවරධනපුර

විශ්වවිද්‍යාලයේ කමනි කළුතන්ත්‍රී, මංජුලා වීරසිංහ, අනුර බමුණුසිංහ, ඒ.එම් විමලරත්න බංඩාර සහ දයාරත්න තිසේරා ද කෘතවේදී ව සිහිපත් කරමි.

අද අප අතර නැතත්, ආදරණීය තාත්තාත්, ආදරණීය කුට්ල අයියාත්,, මා ගේ දිවිගමනට ශක්තියක් වූ අතර ඔවුන් සදා අනුස්මරණය කරනුයේ බැති සිතිනි. දිවා රෑ නොබලා තවමත් මාගේ නැණ පාදන්නට වෙර දරන අම්මාටත්, හර්ෂි අක්කාටත්, සුමිත්‍රා අයියාටත් මෙපමණකින් කෙරෙන තුති පුද නොසෑහෙන බව දනිමි.

එසේ ම, රවීන්ද්‍ර ගේ අම්මාත්, රිස්වාන් අයියා, ශාන්ති අක්කා ද නිරතුරු අප ගේ අභිවෘද්ධිය ප්‍රාර්ථනා කරන ජී. අයි. ඩී. ධර්මසේකර මාමා ඇතුළු ඥාති පිරිස ද සිහිපත් කරනුයේ ඉමහත් සොම්නසිනි.

ගෘහ ජීවිතයේ වගකීම්වලින් මා මුදා හැර, අධ්‍යයන කාර්යයට අවශ්‍ය වන යහපත් ප්‍රසන්න පරිසරයක් නිර්මාණය කර දුන්, ජීවන ගමනේ මාහට ශක්තියක් ම වූ, දයාබර රවීන්ද්‍රත්, "අනේ ගාල්ලේ ආච්චි, අම්මිත් පාඩම්, තාත්තිත් පොත් පාඩම් ආච්චි ඔයාවත් එන්නකෝ මට හරි පාළු යි," කියමින් මෙසේ හුදකලාව කැපවීම් කළ රවිහාරි දියණියන් ද සෙනෙහසින් සමරමි.

අස්සලාරච්චිලාගේ කමනි මනෝරි සේමසිංහ මනම්පේරි

2003-01-01 වෙනිදා

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ

භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ දී ය.

# පටුන

පිදුම i

උපකාරානුස්මෘති ii-iv

පටුන v-vi

හැඳින්වීම vii-x

පළමුවන පරිච්ඡේදය

1 අග්නි සංකල්පය හා එහි ඓතිහාසික වර්ධනය 1-5

1.1 හින්දු මූලාශ්‍රගත අග්නි සංකල්පය 5-19

1.2 බෞද්ධ හා වෙනත් මූලාශ්‍රයගත අග්නි සංකල්පය 19-35

1.3 අග්නි සංකල්පයේ ලාංකේය වර්ධනය 35-47

දෙවන පරිච්ඡේදය

2 ජන දිවිය හා බැඳි අග්නි පිළිබඳ චාරිත්‍ර විධි 48-49

2.1 ගින්නෙහි ප්‍රභවය හා එය ආරක්ෂා කිරීම පිළිබඳ චාරිත්‍ර විධි. 49-57

2.2 අග්නි පිළිබඳ ජනශ්‍රැති 57-69

2.3 උපත, විවාහය, මරණය, හා සම්බන්ධ අග්නි චාරිත්‍ර 69

2.3.i උපත 69-70

2.3.ii විවාහය 70-73

2.3.iii මරණය 73-76

2.3.iv අග්නි සම්බන්ධ වන වෙනත් චාරිත්‍ර විධි 76-91

2.4. ලාංකේය ජන දිවිය හා බැඳි අග්නි පිළිබඳ චාරිත්‍ර. 92-99

## තෙවන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 3 | ලාංකේය කලා ශිල්පවලින් නිරූපිත අග්නි සංකල්පය. | 100-118 |


## සිව්වන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 4 | පහතරට ශාන්තිකර්මවල එන අග්නි සංකල්පය | 119 |
| 4.1 | ශාන්තිකර්ම යන පදයෙහි අර්ථ විග්‍රහය | 120-123 |
| 4.2 | පහතරට පළාතේ ප්‍රචලිත ශාන්ති කර්ම | 123-128 |
| 4.3 | පහතරට ශාන්තිකර්මවල අග්නි භාවිත වන අවස්ථා | 128-171 |
| 4.4 | රෝග නිවාරණ ක්‍රමයක් ලෙස අග්නි භාවිතයේ මනෝවිද්‍යාත්මක වැදගත්කම. | 171-179 |

| | |
|---|---|
| සමාලෝචනය | 180-183 |
| උපග්‍රන්ථය | 184-199 |
| ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය | 200-210 |
| Bibliography | 211-218 |
| සූචිය | 219-268 |
| චිත්‍රාවලිය | |

# හැඳින්වීම

පහතරට ශාන්තිකර්මවල එන අග්නි සංකල්පය යන මැයෙන් වන මෙම පර්යේෂණ නිබන්ධය පරිච්ඡේද පහකින් ද උපග්‍රන්ථයකින් හා චිත්‍රාවලියකින් ද සමන්විත වේ. මෙම නිබන්ධය සම්පාදනය කිරීමේ මූලික අරමුණ වූයේ පහතරට ශාන්තිකර්ම+වල එන අග්නි සංකල්පය පිළිබඳ ව මෙතෙක් ක්‍රමවත් අධ්‍යයනයක් කර නොමැති බැවින් පහතරට ශාන්තිකර්ම පදනම් කරගනිමින් අග්නි සංකල්පය ගැමි ජනයා ගේ සංස්කෘතික හා සමාජයීය දිවිය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ පූර්ණ අධ්‍යයනයක යෙදීම යි.

මෙහි දී විවිධ රටවල චාරිත්‍ර විධීන්, ජනශ්‍රැතීන් ආදීයේ ද ලාංකේය චාරිත්‍ර විධීන් හා කැටයම් මූර්ති චිත්‍ර ආදියේ ද අග්නි සංකල්පය හා බද්ධ ව ඇති ආකාරය පිළිබඳ ව පූර්ණ අධ්‍යයනයක යෙදීම අරමුණු කෙරේ. එසේ ම නූතන බටහිර මනෝවිද්‍යාවේ චිකිත්සක ක්‍රම විෂයෙහි ද අග්නි බලපැවැත්වෙන අයුරු සොයා-බැලීම සිදු වේ.

පළමු පරිච්ඡේදයෙන් අග්නි සංකල්පය හා එහි ඓතිහාසික වර්ධනය පිළිබඳ අධ්‍යයනය කෙරේ. මෙහි දී විශ්ව ප්‍රභවය හා අග්නි අතර සම්බන්ධය සහ අග්නි යන වචනයේ නිරුක්තියත් හඳුන්වා දෙනු ලැබේ. එසේ ම ආදි මානවයා ගින්න සොයා ගැනීමත් සමඟ ඔවුන් ගේ වන වර්ධනය පිළිබඳ විග්‍රහයට ලක් කිරීම ද සිදු වේ.

බ්‍රාහ්මණික හින්දු සම්ප්‍රදාය තුළ භාරතීයයන් අග්නි දේවත්වයෙහිලා සලකා ඇති බවට ඍග් වේදය, ඡාන්දෝග්‍ය උපනිෂද්, සංස්කෘත ස්මෘති ග්‍රන්ථ ආදියෙහි සාක්ෂි ඇත. මීට අමතර ව රාමායණ වීර කාව්‍යයේ සීතා අග්නි ප්‍රවේශය කළ අවස්ථාව, අග්නිස්තෝම, රාජසූය, අශ්වමේධ ආදී යාගවලට අග්නි දෙවියන් සම්බන්ධ වී ඇති අයුරු විග්‍රහ කෙරේ. තව ද භගවත් ගීතාවේ විමුක්ති මාර්ගත්‍රය සමග අග්නි සම්බන්ධය ද සොයා බැලේ.

පැරණි බෞද්ධ මූලාශ්‍රයන්හි අග්නි දේව සංකල්පය පිළිබඳ සාධනීය ආකල්පයකින් සටහන් නොවන නමුත්, පසු කාලීන බෞද්ධ සම්ප්‍රදාය බ්‍රාහ්මණික අදහස් විෂයෙහි දැඩි ප්‍රතිපක්ෂ බවක් ද නො දක්වයි. හින්දු සංකල්පය බෞද්ධ ඇසින් විවරණය කිරීමට බෞද්ධ දර්ශනය සමත් වූ බව පෙනේ.

බයිබලයේ පැරණි තෙස්තමේන්තුවට අනුව දෙවියන් වහන්සේ ගින්නෙහි මැවුම්කරු වේ. හින්දු යාගවල එන අවස්ථාවන්ට සමාන සංසිද්ධි එහි දී දකගත හැකි වන බැවින් අග්නි සංකල්පය බයිබල දෘෂ්ටියට ගැළපෙන පරිදි හසුරුවා ඇති ආකාරය පැහැදිළි වෙයි. ඉස්ලාම් ආගමික න්‍යායට අනුව අග්නි මාර්ගයෙන් අල්ලා දෙවියන් කැඳවීමක් සඳහන් ව ඇති බැවින් අග්නි දේවත්ත්වයට නගා ඇති බව පෙනේ. මෙම ආගම්වල අග්නි, දෙවියන් හා මනුෂ්‍යයින් සම්බන්ධ කරන මාධ්‍යයක් ලෙසට විස්තර කැරේ.

අග්නි සංකල්පයේ ලාංකේය වර්ධනය පිළිබඳ අධ්‍යයනයේ දී බුදුන් ගේ ලංකාගමනයට අග්නි සම්බන්ධ වී ඇති අයුරු වැදගත් බව සඳහන් කළ යුතු ය. මහින්දාගමනයට පෙර ද බ්‍රාහ්මණ බලය තිබීම ලාංකේය ජනයා අතර අග්නි දේව පූජා තිබූ බවට අනුමාන කිරීමට ඉඩ දෙන සාක්ෂියකි. අග්නි වන්දනය පරිවර්තනයකට ලක්වීම පිළිබඳ ව සඳහන් කෙරෙන අතර බෞද්ධ ආභාසය නිසා හින්දු අග්නි පූජාව ලාංකේයකරණයට ලක් වූ අන්දම ද සාකච්ඡා කැරේ. සිංහල සාහිත්‍ය මූලාශ්‍රයන් වන සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය, පූජාවලිය, බුදුගුණාලංකාරය තුළින් අග්නි සංකල්පය විග්‍රහයට ලක් වේ.

ජන දිවිය හා බැදුණු අග්නි පිළිබඳ චාරිත්‍රවිධි හඳුනාගැනීමට දෙවැනි පරිච්ඡේදය වෙන් කොට ඇත. ගින්න උපදවාගැනීම, ආරක්ෂා කිරීම හෙවත් නොනිවා පවත්වාගෙන යාම පිළිබඳ චාරිත්‍ර විධි බොහෝ ශිෂ්ටාචාරවල වේ. රෝම, අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව, ලතින් ඇමරිකාව, බ්‍රිතාන්‍යය, අයර්ලන්තය, පැරණි ග්‍රීසිය, උගන්ඩාව, ලංකාව ආදී රටවල් රැසක වැසියන් අතර මෙම චාරිත්‍ර විධි ප්‍රබලව ක්‍රියාත්මක වූ අන්දම අප ගේ නිබන්ධයෙහි දී සාකච්ඡාවට ලක් කෙරේ.

ජීවිතයට අතිශයින් සමීප වූ ගින්න පසුකාලයේ දී මනුෂ්‍යයා තමාට වුවමනා පරිදි සකස් කොටගත් අතර, ඒ පිළිබඳ ජනකතා රාශියක් පවතී. ගින්න පිළිබඳ ජනශ්‍රැති අප්‍රිකාව, ග්‍රීසිය, චීනය, ඉන්දියාව, ලංකාව ආදී රටවල ව්‍යාප්ත ව පවතින බව පෙනේ. විවිධ සමාජවල පවතින ජීවන අවස්ථාවලට ද ගින්න සම්බන්ධ කැරේ. ඒ අතරින් ලතින් ඇමරිකානු, ස්ලෝවේනියානු හා රුසියාවේ එස්තෝනියානු ජාතිකයන් අතර ප්‍රචලිත උපත හා බැදුනු ගින්න සම්බන්ධ චාරිත්‍ර විධි සාකච්ඡාවට බඳුන් වේ. ඉන්දියානුවන් අතර පවතින විවාහ චාරිත්‍රවලට අග්නි සම්බන්ධ වන අයුරු ද විශේෂයෙන් සලකා බැලෙන අතර, ඕස්ට්‍රේලියානු, චීන ආදී ජාතිකයන් ගේ මරණය සම්බන්ධ චාරිත්‍ර විධින් සමඟ අග්නි සම්බන්ධ වන ආකාරය විමර්ශනය කිරීම සිදුවන්නේ ද මෙම පරිච්ඡේදයේ දී ය. මේ හැරුණු විට ගැබ් ගැන්වීම, අපල උපද්‍රව දුරු කරගැනීම, වගාවන් සරුකරගැනීම, පව්